www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බටහිර බෙංගාලයේ ජන ඝාතනයෙන් ඉක්බිතිව: ඉන්දියානු කම්කරුවෝ ස්වාධීන සමාජවාදී ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කල යුතු ය

**In wake of West Bengal massacre: Indian workers must advance an independent socialist programme**

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2007 මාර්තු 23**

පසු ගිය සතියේ නන්දිග්‍රාමයේ ගොවීන් ගනනාවකට පොලිස් වෙඩි ප්‍රහාරයක් එල්ල වීම සම්බන්ධයෙන් ඉන්දියාව පුරා නැගෙන මහජන විරෝධයට මුහුන දී සිටින තතු යටතේ ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂය (සීපීඑම්) විසින් නායකත්වය දෙනු ලබන බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව එම අර්බුදය පාලනය කර ගැනීමේ මංමුලා සහගත උපාමාරුවක යෙදී සිටී.

මාර්තු 17 දා වාම පෙරමුනු ආන්ඩුව නිවේදනය කලේ විශේෂ ආර්ථික කලාපයක් ගොඩනගනු පිනිස නන්දිග්‍රාමයේ ඉඩම් පවරා ගැනීමට ප්‍රාන්ත ආන්ඩුව ක්‍රියා නොකරන බව යි. ප්‍රදේශයේ රඳවා ඇති දැවැන්ත පොලිස් බලකාය "අදියර වසයෙන්" අඩු කරන බවත් බටහිර බෙංගාලයේ විශේෂ ආර්ථික කලාප සඳහා ඉඩම් පවරා ගැනීම තාවකාලිකව අත්හිටුවන බවත් ඔවුහු තව දුරටත් ප්‍රකාශ කලහ.

ඉන්දුනීසියාවේ පාදක සලිම් ගෲප් සංගතය විසින් පාලනය කරනු ලබන විශේෂ ආර්ථික කලාපයක් සඳහා නන්දිග්‍රාම් ප්‍රදේශයේ ඉඩම් අක්කර 10,000ක් අත්පත් කර ගැනීමේ ආන්ඩුවේ සැලසුම්වලට විරෝධය දැක්වූ ගොවි ජනතාවට මාර්තු 14 දා පොලීසිය එල්ල කල වෙඩි ප්‍රහාරයෙන් ගොවීන් 14ක් ඝාතනයට ලක්ව අඩු ගනනේ 75ක් තුවාල ලැබී ය. ප්‍රාන්ත මහ ඇමති සහ සීපීඑම් දේශපාලන මන්ඩල සභික බුද්දාඩෙබ් භට්ටාචාර්ජී, ප්‍රදේශය තුල ආන්ඩුවේ අධිකාරිය යලි තහවුරු කරනු වස් මැනවින් සන්නද්ධ 4000ක පොලිස් බල ඇනියක් යැවී ය. සීපීඑම් මැර ගුන්ඩන් ද පොලිස් ප්‍රහාරයට සම්බන්ධ වූ බවට දැන් සාක්ෂ්‍ය මතු වෙමින් පවතී.

ගැඹුරු මහජන වෛරය පෙන්නුම් කරමින්, බටහිර බෙංගාලය පුරා මහජනතාව මාර්තු 16 දා මහා වැඩ වර්ජනයක නිරත වූහ. විරෝධතාකරුවෝ ප්‍රාන්තය පුරා මංමාවත් හා දුම්රිය මාර්ග අවහිර කලහ. බටහිර බෙංගාලයේ අගනුවර වන කොල්කතාවේ දී පෙලපාලිකරුවෝ පොලීසිය සමග ගැටුනහ. පාසල් හා විශ්වවිද්‍යාල වසා දමා තිබූ අතර ආන්ඩුවේ කාර්යාලවලින් වාර්තා වූයේ සියයට 20-25 අතර පැමිනීමකි. ආන්ඩුව විසින් බලමුලු ගන්වන ලද පොලීසිය ප්‍රාන්තය පුරා 1,400ක පිරිසක් අත් අඩංගුවට ගත්හ.

මහජන වෛරය කෙතරම් ද කිය තොත්, වාම පෙරමුනේ හවුල්කාර පක්ෂ තුනක් වන ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (සීපීඅයි), විප්ලවවාදී කොමියුනිස්ට පක්ෂය (ආර්එස්පී) සහ ඉදිරිගාමී පෙරමුන (එෆ්බී) වර්ජනයට සහාය පල කලහ. සීපීඑම් මහ ඇමති ක්‍රියා කලේ සමස්තයක් ලෙස වාම පෙරමුන විසින් අනුමත කරනු ලැබ ඇති නව ලිබරල්වාදී ආර්ථික පිලිවෙත් අනුව වන නමුදු, මෙම පක්ෂ එමගින් උත්සාහ කලේ මහ ඇමතිගේ ක්‍රියාවන්ගෙන් දුරස්ථ වීමට යි.

දක්ෂිනාංශික ත්‍රිනමූල් (පොදු ජන) කොංග්‍රසය විසින් නායකත්වය දෙනු ලබන හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) ඇතුලත් විපාර්ශ්වික පෙරමුනක් ද වර්ජනයට සහාය දුන්නේ ය. වැඩ කරන ජනතාව අතර බොහෝ සෙයින් අපකීර්තියට පත්ව ඇති මෙම ධනේශ්වර පක්ෂ උත්සාහ කරන්නේ සිය දක්ෂිනාංශික න්‍යාය පත්‍රයට තල්ලුවක් ලබා ගනු වස් බටහිර බෙංගාල ආන්ඩුවට එරෙහි මහජන මනෝගතිය ගසාකෑමට යි.

ත්‍රිනමූල් කොංග්‍රසය සහ බීජේපීය වැඩ කරන ජනතාවගේ ජීවන කොන්දේසි බිල්ලට දී ජාත්‍යන්තර ආයෝජකයන් ආකර්ෂය කර ගැනීමට සැලසුම් කෙරුනු ආර්ථික "ප්‍රතිසංස්කරන" පිලිවෙත්වල දෑඩ ආධාරකරුවෝ ය. බීජේපීය විසින් නායකත්වය දෙනු ලැබූ සභාගයක් වන ඉන්දියාවේ මීට පෙර පැවති මධ්‍යම ආන්ඩුව විශේෂ ආර්ථික කලාප වැඩපිලිවෙල සඳහා මූලිකත්වය ගත් අතර කොංග්‍රස් නායකත්වයෙන් යුත් වත්මන් සභාගය එය රට පුරා උද්යෝගිමත්ව ක්‍රියාවට දමමින් සිටී.

ඉන්දියානු හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය වෙනුවෙන් ඉඩම් අල්ලා ගන්නා නාමික "වාම" ආන්ඩුවකට එරෙහිව පීඩිත ජනතාවගේ ආරක්ෂකයන් ලෙස මෙම දක්ෂිනාංශික පක්ෂවලට පෙනී සිටීමට හැකි කොන්දේසි නිර්මානය කිරීම සම්බන්ධයෙන් සීපීඑම් සහ ඔවුන්ගේ සගයෝ මුලුමනින් ම වගකිව යුතු ය.

ජාතික මට්ටමේ දී, ඉන්දියානු ධනේශ්වරයේ සම්ප්‍රදායික පාලක පක්ෂය වන කොංග්‍රස් පක්ෂයේ නායකත්වයෙන් යුත් එක්සත් ප්‍රගතිශීලී සන්ධානයේ (යූපීඒ) සභාග ආන්ඩුව පවත්වා ගෙන යාමේ කර්තව්‍යයට වාම පෙරමුන කර ගසා ඇත. මෙම ආන්ඩුවේ පාලනය යටතේ ආහාර ද්‍රව්‍යවල මිල ගනන් අහස උසට නැග විරැකියාව උග්‍ර වී ඇත්තේ, ඉන්දියාවේ ස්වාභාවික හා මානුෂ්‍ය සම්පත් සූරාකෑමට පහසුකම් ලබා ගනු වස් මූල්‍ය ප්‍රභුව ඉල්ලා සිටින පොදු කාර්ය ව්‍යුහ සංවර්ධන ව්‍යාපෘති සහ මිලිටරිය වෙනුවෙන් දැවැන්ත රාජ්‍ය අරමුදල් යොදවන තතු යටතේ ය.

ග්‍රාමීය දුප්පතුන්ගේ ගැටලු විසඳලනු වස් ස්වකීය ස්වාධීන සමාජවාදී දේශපාලන ක්‍රියාමාර්ගය ඉදිරිපත් කිරිමට කම්කරු පන්තිය පියවර නොගන්නේ නම්, "සමාජවාදී" වාම පෙරමුනේ අපරාධ සම්බන්ධයෙන් පීඩිත ජනතාව අතර වැඩෙන වෛරය ගසාකෑමේ ද එමගින් ඉන්දියානු දේශපාලනය තව දුරටත් දකුනට තල්ලු කිරීමේ ද නිර්බාධිත නිදහසක් ප්‍රතිගාමී බලවේගවලට -- කොංග්‍රස් ආන්ඩුවට සහ බීජේපීය හා ත්‍රිනමූල් කොංග්‍රසය වැනි එහි දක්ෂිනාංශික ප්‍රතිවාදීන්ට -- ලැබෙනු ඇත.

කෲර මර්දනයකට බටහිර බෙංගාල ආන්ඩුව සම්බන්ධ වීම වාම පෙරමුනේ දේශපාලන කීර්තියට බොහෝ සෙයින් වල කපා ඇත යන කරුන සම්බන්ධයෙන් බොහෝ මාධ්‍ය පන්ඩිතයන් දැනටමත් සිය ප්‍රීත්‍යෝන්මාදය ප්‍රකාශයට පත් කර ඇත. අටුවාකරුවන්, අර්බුදය වාම පෙරමුන වඩා දේශපාලනිකව නම්‍යශීලී බවට පත් කරනු ඇතැයි අනාවැකි පල කරමින්, කම්කරු නීති වෙනස් කිරීම් හා සෙසු දක්ෂිනාංශික ප්‍රතිසංස්කරන සඳහා යූපීඒ දරන ප්‍රයත්නයට වාම පෙරමුන ප්‍රසිද්ධියේ දක්වන විරුද්ධත්වය වෙන් කර ගෙන එයට පහර ගසා ඇත.

මාර්තු 14 ජන ඝාතනයට පසු ඉක්බිති දින ගනනාව තුල, සීපීඑම් සහ එහි ප්‍රධාන වාම පෙරමුනු සගයන් වන ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය, ඉදිරිගාමී පෙරමුන හා විප්ලවවාදී සමාජවාදී පක්ෂය හදිසි රැස්වීම් ගනනාවක් පැවැත්වී ය. සමහර සීපීඑම් සගයන් නන්දිග්‍රාමයේ පොලිස් ක්‍රියාවට විරෝධය පල කිරීමක් වසයෙන් බටහිර බෙංගාල ආන්ඩුවෙන් ඉවත් වීමට තර්ජනය කර තිබුනි. කෙසේ වෙතත්, මෙය වනාහි, තමන් හා ජන ඝාතනය අතර යම් දුරස්ථ භාවයක් පෙන්නුම් කිරීමේ සහ බටහිර බෙංගාලය පාලනය කිරීමෙහි ලා තමන්ට මීට වඩා වැඩි ඉඩකඩක් ලබා ගනු පිනිස නන්දිග්‍රාම් ඛෙදවාචකය ගසාකෑමේ සැලසුමෙන් යුක්ත උපායකි.

රැස්වීම්වල අවසානයේ දී, වාම පෙරමුනු හවුල්කරුවන් තීන්දු කලේ ආන්ඩුවේ ආයෝජක-ගැති න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමීමේහි ලා සිය සහයෝගය උත්සන්න කිරීමට යි.

භට්ටාචාර්ජී ජන ඝාතනය සම්බන්ධයෙන් මොන යම් හෝ සමාව ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අතර ආන්ඩුවේ ඉඩම් අත්පත් කර ගැනිමේ වැඩපිලිවෙලට එරෙහි ගොවි ජන විරුද්ධත්වයේ මූලයන් පවතින්නේ දක්ෂිනාංශික-නක්සල්වාදී (මාඕවාදී) ඒකාබද්ධ ප්‍රකෝපකරනයක් තුල ය යන්න ඔහු දිගට ම ඇඟවුම් කරයි. කෙසේ වෙතත්, නිවැරදිව "තත්වය තක්සේරු කිරීමට" තමා අසමත් වූ බව දැන් පිලිගන්නා ඔහු වාම පෙරමුනේ සෙසු පක්ෂ සමග වඩා වැඩි අදහස් විමසීමකින් යුක්තව කටයුතු කිරීමට පොරොන්දු වෙයි. කනගාටුව ප්‍රකාශ කිරීමේ ක්‍රියාවක් ලෙස, භට්ටාචාර්ජී සීපීඅයි නායකයන්ට තමා හමුවීමට එන ලෙස අවධාරනය කරනවා වෙනුවට සීපීඅයි මූලස්ථානයට ගොස් ඔවුන් හමු විය.

ජන ඝාතනයට පසු දින, සීපීඑම් වැඩිමහලු රාජ්‍යතාන්ත්‍රික ජෝති බාසු "වාම පෙරමුනේ කැබිනට් මන්ඩලයට හා කැබිනට් මන්ඩලයේ මධ්‍යම කමිටුවට පවා . . . කිසිවක් නොදන්වා කටයුතු කිරීම" සම්බන්ධයෙන් භට්ටාචාර්ජීව ප්‍රසිද්ධියේ විවේචනය කලේ ය. සිය "දිගු කාලීන දේශපාලන අත්දැකීම්" උපුටා දක්වමින්, ඔහු අනතුරු ඇඟවූයේ සීපීඑම් සංවිධානයට තනියම ආන්ඩුවක් ගෙන යා නොහැකි බව යි. "එය සභාග ආන්ඩුවක් විය යුතු ය." ඔහු අවධාරනය කලේ ය.

බටහිර බෙංගාලය තුල විශේෂ ආර්ථික කලාප නිර්මානය කිරීමේ වාම පෙරමුනු ආන්ඩුවේ පිලිවෙත ඉන්දියාව ලෝක ආර්ථිකය තුලට ඒකාග්‍ර කිරීමට ඉන්දියානු පාලක ප්‍රභුව ගෙන යන දැඩි ව්‍යායාමයේ කොටසකි. බාසු, බටහිර බෙංගාලයේ හිටපු මහ ඇමති ලෙස, විදේශ ඍජු ප්‍රාග්ධනය ආකර්ෂනය කර ගනු වස් ප්‍රධාන බටහිර අගනගර වෙත ආන්ඩුවේ හා ව්‍යාපාරික නියෝජිත කන්ඩායම් යැවීම ඇතුලු පියවර ගනිමින්, ප්‍රාන්තය තුල නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරන සඳහා මාවත සැකසී ය.

ඉන්දියානු ස්වාධීනත්වයෙන් පසු ගත වූ මුල් දශක හතරක කාලය තුල, ස්ටැලින්වාදී පක්ෂ දෙක -- සීපීඑම් හා සීපීඅයි -- ඉන්දියාවේ ධනේශ්වර ජනරජයේ රාමුව ඇතුලත සමාජ ප්‍රතිසංස්කරන සඳහා බල කරමින්, ජාතික-ප්‍රතිසංස්කරනවාදී පිලිවෙත් අනුගමනය කලේ ය. කොංග්‍රස් පක්ෂය සමග පාර්ලිමේන්තු දේශපාලනයේ

දී සහයෝගී වීමට තමන් කොතෙක් දුරට සූදානම් ද යන වග සම්බන්ධයෙන් සීපීඑම් හා සීපීඅයි අතර මතභේද තිබුනු නමුදු ඔවුන් දෙගොල්ල ම ස්ටැලින්වාදී-මෙන්ෂෙවික් අවධි දෙකේ විප්ලව න්‍යාය දැඩි ලෙස ආරක්ෂා කලහ.

අධිරාජ්‍යවාදී පීඩනයේ හා වැඩවසම් පසුගාමිත්වයේ උරුමය මගින් අදහස් කෙරෙන්නේ ඉන්දියානු ධනවාදය ශක්තිමත් කිරීමෙහි ලා ඉන්දියානු ධනේශ්වරයේ ප්‍රගතිශීලී "වැඩවසම් විරෝධී" හා "අධිරාජ්‍ය විරෝධී" යැයි කියනු ලබන කොටස්වල සගයකු ලෙස සේවය කිරීමට වඩා වැඩි යමක් පෙර දැකිය හැකි අනාගත කාලයක් මුලුල්ලේ කම්කරු පන්තියට අපේක්ෂා කල නොහැකි බව යැයි ඔවුහු කියා සිටී.

එනයින් ගත් කල, 1970 ගනන් මුල හා මැද දී, ඉන්දියානු ධනේශ්වරයේ රාජ්‍ය-පාලිත ජාතික සංවර්ධන ව්‍යාපෘතියේ පතුරු ගැලවීමට පටන් ගෙන කම්කරු පන්තියේ හා ගොවි ජනතාවගේ අසහනය මගින් ඉන්දියාව සොලවාලූ කල, සීපීඑම්, ඉන්දිරා ගාන්ධිගේ කොංග්‍රසයට ආකාරගතව බැඳී සිටියේ, ගාන්ධිගේ හදිසි නීතිය පැනවීමට සහයෝගය දීම දක්වා ම ගමන් කරමිනි. ඒ අතරතුර, සීපීඑම්, දකුනෙන් ජන සංග් (බීජේපීයේ පෙරගමන්කරු) සිට සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් දක්වා විහිදෙන ධනේශ්වර පක්ෂවල සන්ධානයක් වූ ජනතා පක්ෂය සමග පොදු පිලිවෙතකට එක් විය.

1977 දී බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව පැන නැංගේ ජනතා පක්ෂයට කම්කරු පන්තිය යටත් කිරීමේ සීපීඑම් පිලිවෙතෙහි අතුරු ඵලයක් ලෙස ය. 1977 බටහිර බෙංගාල මැතිවරනයේ දී, වාම-ජනතා මැතිවරන සන්ධානයක් තුල ආසන බහුතරයක් සිය ජනතා හවුල්කරුවන්ට ලබා දීමට සීපීඑම් ආරම්භයේ දී යෝජනා කලේ ය. ඊටත් වඩා විශාල බහුතරයක් ඉල්ලමින් ජනතා පක්ෂය කල අවධාරනය හේතු කොට ගෙන සන්ධානය බිඳ විසුරුනු කල, කම්කරු-ගොවි අසන්තෘප්ති රැල්ලක් මතින් ස්ටැලින්වාදීන් බලයට තල්ලු කෙරුනේ ඔවුන්ව ම තුෂ්නිම්භූත කරමිනි.

ඔවුන් බලයේ සිටි මුල් වාරය තුල සීමිත ඉඩම් ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමට බටහිර බෙංගාලයේ වාම පෙරමුනු ආන්ඩුව කටයුතු කල අතර එය ගම්බද ජනතාව අතර ඔවුන්ට බලගතු ඡන්ද පදනමක් සහතික කලේ ය. එමෙන් ම ඉන්දියාවේ ධනේශ්වර ජනරජයේ ව්‍යවස්ථාවට හා දේශපාලන සම්මුතිවලට වාම පෙරමුන භක්තිමත්ව බැඳී ගත්තේ ය.

කෙසේ වෙතත්, 1991 සිට, ස්ටැලින්වාදියෝ සිය සම්ප්‍රදායික ජාතික-ප්‍රතිසංස්කරනවාදී පිලිවෙත් අතහැර දමා ඇත. සීපීඑම් හා වාම පෙරමුන, සමස්තයක් ලෙස ඉන්දියානු දේශපාලන සංස්ථාපිතයට නොඅඩු ලෙස, පුද්ගලීකරනයට, නියාමන හරනයට සහ කෘෂි නිෂ්පාදනවල සහතික මිල ක්‍රමය, පොදු හා සමාජ සේවාවන් කප්පාදු කිරීමට සහයෝගය දෙමින්, ඉන්දියාවේ ජාතිකව පරිපාලිත ආර්ථිකය බිඳ විසුරුවා හැරීමේ හා ඉන්දියාව ලෝක ධනේශ්වර ආර්ථිකයට මුලුමනින් ම ඒකාග්‍ර කිරීමේ ව්‍යායාමයට සහභාගී වී ඇත.

පසු ගිය වසරේ ප්‍රාන්ත මැතිවරනයට ක්ෂනිකව පෙරාතුව, තව දුරටත් දකුනට ගමන් කිරීමට සූදානම් වීමේ සිය ප්‍රයත්නයේ කොටසක් ලෙස, භට්ටාචාර්ජී ප්‍රකාශ කලේ, මනුෂ්‍ය වර්ගයා අවසානයේ දී සමාජවාදය දිශාවලට පරිනාමය වන බවට තමන් තවමත් පුද්ගලිකව ඒත්තු ගෙන සිටින බවට කියා පාන නමුත් තමන් ආයෝජක-හිතැති පිලිවෙත් අනුගමනය කරනු ඇති බව යි. "වත්මන් යථාර්ථය පිලිගැනීමේ පදනම මත වැඩ කිරීමට යි . . . මා උත්සාහ කරන්නේ. . . . අප ප්‍රායෝගික වන බැවින්, සමස්ත ලෝකය ම ධනවාදය වැලඳගනිමින් සිටින මොහොතක ධනවාදී වීම නුවනක්කාර බට අප දන්නවා." යැයි ඔහු පැවසී ය.

පසු ගිය මාස කිහිපය තිස්සේ, සීපීඑම් හා භට්ටාචාර්ජී බටහිර බෙංගාලයේ ශීඝ්‍ර "කාර්මීකරනය හා සංවර්ධනය" සඳහා වූ සිය ව්‍යායාමය උත්සන්න කර තිබේ. ආර්ථික සෞභාග්‍යය සහ සමාජ, ආර්ථික හා සංස්කෘතික වැඩි දියුනුව සඳහා යතුර වන්නේ බටහිර බෙංගාලයේ ආයෝජනය කරන ලෙස ඉන්දියානු හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය ඒත්තු ගැන්වීම යැයි ඔවුහු තර්ක කරති.

නන්දිග්‍රාමයේ සිද්ධීන් එහි ලේ වැකි ප්‍රතිඵලය යි.

විදේශ ධනවාදී ආයෝජන මහජනතාව සඳහා ප්‍රතිලාභ පහලට කාන්දු කරනු ඇතැයි කියාපෑම මගින් ස්ටැලින්වාදීන් ප්‍රතිරාවය කරන්නේ නව-ලිබරල්වාදී දෘෂ්ටිවාදය යි.

ධනවාදයේ රාමුව තුල නිෂ්පාදනය භූගෝලීයකරනය වීම ලෝකයේ සෑම රටක ම ගැඹුරු වන සමාජ අසමානතාවක් නිර්මානය කර තිබේ. වැඩි දියුනු රටවල බහුජාතික සංගත විසින් ලාභ හඹා යාම වැටුප්, සමාජ සුභසාධන වැඩපිලිවෙලවල් හා සෙසු ප්‍රතිලාභ මත එල්ල කෙරෙන ප්‍රහාර මාලාවක් සමග අත්වැල් බැඳ ගෙන ඇත. පසුගාමී රටවල දරිද්‍රතාවයේ ගිලී ජීවත් වන කෝටි සංඛ්‍යාත ජනයා ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ ලාභ ශ්‍රම උල්පත් බවට පත්ව තිබේ.

ඉන්දියාවේ කැපී පෙනෙන යථාර්ථය වී ඇත්තේ මෙම පිලිවෙත් කම්කරුවන්ගේ හෝ ගම්බද දුගීන්ගේ කොන්දේසි වැඩි දියුනු කර නැති බව යි. ඉවසිය නොහැකි කොන්දේසි හේතු කොට ගෙන මෑත වසරවල දහස් ගනන් ගොවීන් සිය දිවි නසා ගෙන ඇත.

සීපීඑම් කියා පාන පරිදි, සූරාකන ලෝක ධනවාදී ක්‍රමයට රට ඒකාග්‍ර කිරීම සහ හැකි තරම් ලාභම ශ්‍රමය හා හැකි ඉහල ම ලාභ අනුපාතික සොයමින් භූගෝලය පුරා සැරි සරන ජාත්‍යන්තර ධනවාදීන් ආකර්ෂනය කර ගැනීම මගින්, "කාර්මීකරනය හා සංවර්ධනය" හරහා සමාජයේ අති මහත් බහුතරය සඳහා කිසිදු ප්‍රතිලාභයක් අත්පත් කර ගත නොහැකි ය.

එමෙන් ම, විද්‍යාවේ හා තාක්ෂනයේ සිදු වී ඇති දැවැන්ත විප්ලවවාදී වර්ධනයන් ඉන්දියාව ඇතුලු ලොව පුරා මහජනතාවගේ දරිද්‍රතාව තුරන් කිරීම හා ජීවන මට්ටම් උසස් කිරීම පිනිස යොදා ගත හැකි ය -- එහෙත් ඒ ධනවාදී ලාභ ගරන ක්‍රමය පෙරලා දමා සැලසුම් සහගත සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීමේ ජාත්‍යන්තර අරගලයක පදනම මත ම පමනි.

කම්කරු පන්තිය, පාලක ප්‍රභූවේ සහ එහි වල්ගාකරුවන් වන සීපීඑම් හා වාම පෙරමුනේ පිලිවෙත්වලට විරුද්ධව, වැඩ කරන ජනතාවගේත් ඉඩම් අහිමි හා දරිද්‍රතාවයේ ගිලුනු ගම්බද දුගීන්ගේත් සමාජ ගැටලුවලට ආමන්ත්‍රනය කරන ස්වකීය වැඩපිලිවෙලක් ඉදිරිපත් කල යුතු ය. මෙයින් අදහස් කරන්නේ වරප්‍රසාදිත ප්‍රභුවක වෙනුවට මහජනතාවගේ අති මහත් බහුතරයේ ප්‍රතිලාභ වෙනුවෙන් ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම යි.

මෙම වැඩපිලිවෙල සාක්ෂාත් කර ගත හැක්කේ, ඉන්දියානු උප-මහාද්වීපයේ හා දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක රූපාකාරයෙන් කම්කරු-ගොවි ආන්ඩු ගොඩනගනු පිනිස පීඩිත ගොවි ජනතාව සමග සන්ධානයකින් කම්කරු පන්තිය බලමුලු ගැන්වීම මගින් ගෙන යන ජාත්‍යන්තර සමාජවාදය සඳහා වූ අරගලයේ කොටසක් ලෙස ය.

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ එහි ප්‍රකාශනය වන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මෙම ඉදිරිදර්ශනය ඉදිරිපත් කරයි. මෙම ඉදිරිදර්ශනය සැලකිල්ලට යොමු කොට ඉන්දියාවේ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවක් ගොඩනැගීමේ අරගලයට එක්වන ලෙස සමාජීයව දැනුවත් කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org